# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි හතරවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2018/2019

## BST 4179 – පර්යේෂණ ක්‍රමවිද්‍යාව

(පැ දෙකයි)

ප්‍රශ්න <u>තුනකට</u> (03) පිළිතුරු සපයන්න.

---

1. පර්යේෂකයන් විසින් කරනු ලබන ඥාන සම්පාදන ක්‍රියාවලියේ දී සත්භාවවේදය, ඥානමීමංසාව, ක්‍රමවේද සහ විධික්‍රම සමග බැඳුණු ප්‍රශ්න සපයන ආලෝකය සාකච්ඡා කරන්න.

2. තර්කාභාස (Fallacy) සාර්ථක පර්යේෂණකරණයට බාධා කරන ආකාරය අදාළත්වය පිළිබඳ තර්කාභාස (Fallacies of relevance) විෂයයෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

3. ප්‍රත්‍යක්ෂමූලවාදීන් විසින් යෝජනා කරන ලද උපන්‍යාස සංකල්පය පැහැදිලි කොට ඒ පිළිබඳ විවේචනාත්මක විවරණයක් ඉදිරිපත් කරන්න.

4. පර්යේෂණ ගැටලුව (Research Problem) සහ පර්යේෂණ ප්‍රශ්න (Research Questions) අතර පවත්නා වෙනස පැහැදිලි කරමින් සාර්ථක පර්යේෂණයක් සඳහා ඒවායින් සැපයෙන ආලෝකය පරීක්ෂා කරන්න.

5. සාරසංක්ෂේප (Abstracts) රචනයේ විවිධ ප්‍රභේද පැහැදිලි කොට එහි ඇතුළත් නොකළ යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න.

6. පහත සඳහන් මාතෘකා <u>දෙකකට</u> ප්‍රමාණවත් සටහන් ලියන්න.

   අ). අර්ථව්‍යාකූලත්වය පිළිබඳ තර්කාභාස

   ආ). සාහිත්‍ය විමර්ශනය

   ඉ). මූලාශ්‍රය සටහන් යෙදීම

   ඊ). වාස්තවිකවාදී ක්‍රමවේදය

*******************